17
පාඩම
सप्तदशः पाठः

# वाक्यं रसात्मकं काव्यम् ।

"වාක්‍යං රසාත්මකං කාව්‍යම්" රසය ආත්මගත වූ වාක්‍යය කාව්‍යය වේ. කවියා මෙන් ම කවිය ද නිරායාසයෙන් පහළ වන අතර උපද්දවනු නො හැකි ය. කවියක සුන්දරත්වය ශබ්ද රසය හා අර්ථ රසය මත රඳේ. කවිත්වය සහජ උරුමයකි. කාව්‍යාදර්ශය රචනා කළ දණ්ඩින් නම් විචාරකයා කවියකු සතු විය යුතු ප්‍රධාන ලක්‍ෂණ 04 ක් පෙන්වා දී ඇත.

01. නිසර්ග හැකියාව — "නෛර්ගකී ච ප්‍රතිභා
02. ප්‍රතිභාව — ශ්‍රුතඤ්ච බහුනිර්මලම්
03. බහුශ්‍රැතභාවය — අමන්දශ්චාභියොගොඝ්‍යාඃ
04. සතතාභ්‍යාසය — කාරණං කාව්‍යසම්පදඃ" යනු ඒවා ය.

මේ ලක්‍ෂණයන්ගෙන් අනූන කාව්‍යනිර්මාණ රාශියක් සංස්කෘත කාව්‍ය සාහිත්‍යය සතු වේ. ශ්‍රව්‍ය හා දෘශ්‍ය යන ප්‍රධාන කාව්‍ය ප්‍රභේද දෙක අතරින් මහාකාව්‍ය ශ්‍රව්‍යකාව්‍ය වර්ගයට අයත් වේ. මහාකාව්‍ය, ඛණ්ඩකාව්‍ය හා චම්පූකාව්‍ය ප්‍රධාන පද්‍යකාව්‍ය වර්ගත්‍රය යි. මහාකාව්‍යයක ඇතුළත් විය යුතු ලක්‍ෂණ කාව්‍යාදර්ශය, සාහිත්‍යදර්පණ යනාදි කාව්‍ය විචාර ග්‍රන්ථයන්හි සඳහන් වේ.

1. පරිච්ඡේද සර්ග නමින් හැඳින්වීම
2. කථා නායකයා ධීරෝදාත්ත වීම
3. ශෘංගාර, වීර හා ශාන්ත යන රස අතරින් එකක් ප්‍රධාන රසය වීම
4. ආශිර්වාදයකින් හෝ නමස්කාරයකින් නැතහොත් වස්තු නිර්දේශයකින් ඇරඹීම
5. ඉතිහාස කථාවක් හෝ උසස් අයෙකුගේ චරිතාපදානයක් කථා ශරීරය වීම
6. සර්ග 08 කට නො අඩු - සර්ග 30 කට නො වැඩි වීම
7. වන, පර්වත, ඍතු, උදය, චන්ද්‍රෝදය, සූර්යෝදය, සන්ධ්‍යා, උයන්කෙළි ආදි වර්ණනා
8. විවාහ, සංයෝග, වියෝග, විහාර, යුද්ධ, ජය, පුත්‍රෝත්පත්තිය

යනු යථෝක්ත ග්‍රන්ථයන්හි සාකච්ඡා කර ඇති ප්‍රධාන මහාකාව්‍ය ලක්‍ෂණ කිහිපයකි.

මහාකාව්‍ය පරම්පරාවේ ප්‍රථම කවීන්ද්‍රයා මහාකවි භදන්ත අශ්වඝෝෂ පාදයන් ය. උන්වහන්සේ මහාකාව්‍ය දෙකක් රචනා කළහ. බුද්ධචරිත මහාකාව්‍ය ඉන් පළමුවැන්නයි. එහි සර්ග 13 ක් වේ. බුදුහිමියන්ගේ චරිතාපදානය මෙහි ප්‍රධාන වස්තු විෂය වේ. භදන්තාශ්වඝෝෂ මාහිමියන්ගේ දෙවන මහාකාව්‍ය සෞන්දරනන්දයයි. සර්ග 18 කින් සමන්විත එහි ප්‍රධාන කථා නායක - නායිකා දෙපළ නන්ද කුමරු හා ජනපදකල්‍යාණිය යි. භදන්තාශ්වඝෝෂ හිමියන්ගේ කාව්‍යකරණයෙහි ප්‍රධාන අරමුණ ධර්මසන්නිවේදනය යි. රෝගියකුට මී පැණි තවරා තික්ත ඖෂධ ලබා දෙන්නා සේ, ඉතා ගැඹුරු සියුම් ධර්ම කොටස් කවි රසෙහි තවරා කෙලෙස් රෝගයෙන් පරිපීඩිත ජනයාට ලබාදීම උන්වහන්සේගේ මුඛ්‍යාභිලාෂය වී තිබේ.

උපමා යෙදීමෙහි සූරයකු **(උපමා කාලිදාසස්‍ය)** වන මහාකවි කාලිදාසයන් විසින් **රඝුවංශ මහාකාව්‍ය** හා **කුමාරසම්භව මහාකාව්‍ය** යනුවෙන් මහාකාව්‍ය ග්‍රන්ථ දෙකක් රචනා කරන ලදී. **දිලීප, අජ, දශරථ** හා **රාමාදි** රඝු පරම්පරාවේ රජවරුන් පස්දෙනෙක් පිළිබඳ ව රඝුවංශ මහාකාව්‍යයෙහි වර්ණනා වේ. සර්ග 19 කින් හා පද්‍ය 1576 කින් යුක්ත මෙය මහාකවි කාලිදාසයන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය මතුවන විශිෂ්ට මහාකාව්‍යයකි. මීට අමතර ව ශිව හා පාර්වතී යන දිව්‍ය දම්පතීන්ගේ ප්‍රේමවෘත්තාන්තය තේමා කරගත්, කුමාරසම්භව මහාකාව්‍යය, ස්කන්ද හෙවත් **කාර්තිකෝත්පත්තිය** ප්‍රමුඛකොටගත් තොරතුරු රසභාවපූර්ණ ව වර්ණනා කෙරෙන මහාර්ඝ නිර්මාණයකි. මෙහි සර්ග සංඛ්‍යාව 17 කි.

මහාකවි කාලිදාසයන්ට පසුව **භාරවී, මාඝ, භට්ටී, ශ්‍රී හර්ෂදේව** වැනි ප්‍රසිද්ධ කවිවරු විසූහ. ඔවුහු පිළිවෙළින් **කිරාතාර්ජුනීය, ශිශුපාලවධ, රාවණවධ** හා **නෛෂධචරිතය** වැනි මහාකාව්‍ය රචනා කළ හ. මීට අමතර ව, **රත්නාකාර, ශිවාස්වාමි, මංඛ, ධර්මනාථ** වැනි පසුකාලීන මහාකාව්‍ය රචකයෝ ද **හරවිජය, ශ්‍රී කණ්ඨචරිත, පාණ්ඩවපුරාණ** ආදි මහාකාව්‍ය රචනා කළහ. එහෙත් ඒවා මහාකවි කාලිදාස හා භදන්තාශ්වඝෝෂ හිමියන්ගේ නිර්මාණ මෙන් ජනප්‍රිය නොවූහ.

අතිශය ජනප්‍රිය හා ආහ්ලාදකර වූ සංස්කෘත සාහිත්‍යාගත මෙම මහාකාව්‍යය රචනා කලාව අනුව යමින් ලක්දිව පඬිවරු ද මහාකාව්‍යකරණයෙහි යෙදුනහ. ලාංකේය පළමු සංස්කෘත මහාකාව්‍ය රචකයා, **කුමාරදාස රජු** ය. ඔහුගේ කෘතිය **ජානකීහරණ** නම් වේ. සර්ග 20 කින් සුසැදි මෙහි රාම හා සීතා කථාව වර්ණනා කෙරේ. **පද්‍යචූඩාමණි** යනු කැකුණෑවල පියරතන හිමියන් විසින් මෑතකාලයෙහි රචනා කරන ලද මහාකාව්‍යය යි.

**मणिना भूषितः सर्पः किमसौ न भयङ्करः।**
**මණිනා භූෂිතඃ සර්පඃ කිමසෞ න භයඞ්කරඃ**
**මැණිකෙන් අලඞ්කාර වුවත් සර්පයා බියකරු නොවේ ද?**

**मन एव मनुष्याणां कारणं बन्धमोक्षयोः।**
**මන ඒව මනුෂ්‍යාණාං කාරණං බන්ධමෝක්ෂයෝඃ**
**මිනිසුන්ගේ බැඳීමට හෝ මිදීමට හේතුව සිතම ය.**

**मनस्येकं वचस्येकं कर्मण्येकं महात्मनाम्।**
**මනස්‍යෙකං වචස්‍යෙකං කර්මණ්‍යෙකං මහාත්මනාම්**
**උතුමන්ගේ සිතේ, වචනයේ හා ක්‍රියාවේ ඇත්තේ එක ම කරුණකි.**